සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය**

# චිත්‍ර කලාව - I

**කාලය පැය 1 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් පින්තූරය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01. මෙම රූපයෙන් දැක්වෙන්නේ .......................................................... නැමැති වාස්තු විද්‍යාත්මක නිර්මාණයයි.

02. මෙම ගොඩනැගිලි සංකීර්ණයේ ඇති සුවිශේෂී අංගය ......................................................... නමින් හඳුන්වයි.

03. මෙහි අටපට්ටම් හැඩයෙන් යුතු වාස්තු විද්‍යාත්මක අංගය නිර්මාණය කිරීමේ ගෞරවය හිමි වන්නේ ............................................................. ශිල්පියාට ය.

04. මෙම ගොඩනැගිල්ල තුළ .............................................................. යුගයට අයත් සිතුවම් රැසක් දැකිය හැක.

05. මෙහි ඇති සඳකඩ පහණ මධ්‍යයේ මදක් උස්වූ .............................................................. ක් කැටයම් කර ඇත.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

06. විජයොත්පාය නමැති වාස්තු විද්‍යාත්මක අංගය අයත් වන්නේ කුමන විහාරස්ථානයටද?

........................................................................................................................................................

07. ඇම්බැක්කේ දේවාලයේ දිග්ගෙය නැමැති කොටසෙහි තිබෙන දැව කණු සංඛ්‍යාව කොපමණද?

........................................................................................................................................................

08. මහනුවර යුගයට අයත් මැදවල විහාරය ඉදි කර ඇත්තේ කුමන වර්ගයේ කණු මතද ?

..........................................................................................................................................

09. ලංකාතිලක විහාරයේ ඇති හිඳි බුද්ධ ප්‍රතිමාවේ චීවරයේ රැළි දක්වා ඇති ආකාරය කුමක්ද?

..........................................................................................................................................

10. පර්වත මස්තකයේ දේව මැණියෝ නමැති පුනර්ජීවන යුගයට අයත් නිර්මාණය කාගේ සිතුවමක්ද?

..........................................................................................................................................

- **අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. සාම්ප්‍රදායික සැරසිල්ලක් වන නෙළුම් මල,

(1) සත්ත්ව ගණයට අයත් මෝස්තරයකි. (2) දිව්‍ය ගණයට අයත් මෝස්තරයකි.
(3) උද්භිද ගණයට අයත් මෝස්තරයකි. (4) නිර්ජීව ගණයට අයත් මෝස්තරයකි.

12. අඩි 17 පමණ දිග බයිසන් රුව දක්නට ලැබෙන්නේ,

(1) ප්‍රංශයේ ලැස්කෝ ගුහාවෙහිය. (2) ප්‍රංශයේ ෆොන්ඩිගෝම් ගුහාවෙහිය.
(3) ස්පාඤ්ඤයේ අල්ටමයිරා ගුහාවෙහිය. (4) ස්පාඤ්ඤයේ කෝගුල් ගුහාවෙහිය.

13. අනුරාධපුර යුගය ට අයත් බුම්බුලාකාර හැඩයෙන් යුතු චෛත්‍යය වන්නේ,

(1) ජේතවන දාගැබයි. (2) අභයගිරි දාගැබයි.
(3) ථූපාරාම දාගැබයි. (4) රුවන්වැලි දාගැබයි.

14. ශාන්තිකර්ම වලදී සැරසිලි සඳහා,

(1) දැව භාවිතයට ගැනේ. (2) කඩදාසි භාවිතයට ගැනේ.
(3) පොලිතින් භාවිතයට ගැනේ. (4) ගොක්කොළ භාවිතයට ගැනේ.

15. රත්න ප්‍රාසාදය අසල මුරගලෙහි ප්‍රධාන කැටයම සඳහා

(1) නා රජ රුව යොදා ඇත. (2) බහිරව රුව යොදා ඇත.
(3) නාගරුව යොදා ඇත. (4) පුන්කලස යොදා ඇත.

- **අංක 16 සිට 20 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

16. සඳකඩ පහණ ..........................................................................................

17. වටදාගෙය ..........................................................................................

18. නාරිලතා මල ..........................................................................................

19. පිරමීඩ ..........................................................................................

20. ප්‍රෙස්කෝ බුවනෝ ..........................................................................................

- ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති රූප සටහන්වලට සමීප සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියෙන් ඇති **A, B, C, D, E** යන ඒවා අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.

21.  ....................................  **A**

22.  ....................................  **B**

23.  ....................................  **C**

24.  ....................................  **D**

25.  ....................................  **E**

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති එක් එක් වාක්‍යයන්හි හිස්තැනට සුදුසු වචනය / වචන යොදා සම්පූර්ණ කරන්න.**

26. මහනුවර යුගයේ බුද්ධ ප්‍රතිමාව නිර්මාණයේදී ශිල්පියා බුදුන් වහන්සේගේ අධ්‍යාත්මික ගුණයට වඩා ........................................................................... පෙනුම ගැන සැලකිලිමත් විය.

27. ගල් කණු මත ඉදි කරන ලද ප්‍රතිමා ගෘහය ........................................................................... විහාර ලෙස හඳුන්වයි.

28. පිත්තල කර්මාන්තයේදී ඉලත්තට්ටුව නිර්මාණය කිරීම සඳහා ..................................................ශිල්ප ක්‍රමය යොදා ගනී.

29. රෝමයේ ශාන්ත පීතර දෙව් මැදුරේ ඇති මයිකල් ආන්ජලෝගේ නිර්මාණයක් වන පියෙටා මූර්තිය ........................................................................... උන්නතව නෙළා ඇත.

30. ගෝතමී විහාරයේ මාරපරාජය සිතුවමේ ........................................................................... හැඩතල භාවිතා කිරීම නිසා මුහුණුවල භයංකර බව ඉස්මතු වී පෙනේ.

- **අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| | | | | |
|---|---|---|---|---|
|  |  |  |  |  |
| F | G | H | I | J |

31. F අක්ෂරයෙන් දැක්වෙන වාස්තු විද්‍යාත්මක අංගය අයත් වන යුගය නම් කරන්න. .....................................

32. G අක්ෂරයෙන් දැක්වෙන වියන් සිතුවම දක්නට ඇති ස්ථානය කුමක්ද? ............................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන M. සාර්ලිස් ශිල්පියාගේ චිත්‍රයේ වස්ත්‍රාභරණ සඳහා බලපා ඇති සම්ප්‍රදාය කුමන රටකට අයත්ද? .............................................................................

34. I අක්ෂරයෙන් දැක්වෙන්නේ කොළඹ යුගයට අයත් ශිල්පියෙකුගේ නිර්මාණයකි. එම ශිල්පියා කවුද?
.......................................................................................

35. J අක්ෂරයෙන් දැක්වෙන කුරුළු දඩයම සිතුවමේ දක්නට ඇති පැලැටි විශේෂය හඳුන්වන නම කුමක්ද?
.......................................................................................



- **පහත දැක්වෙන චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.**

36. ශිල්පියා ..............................................................................

37. තේමාව ..............................................................................

38. යුගය ..............................................................................

39. වර්ණ භාවිතය ..............................................................................

40. හැඟීම් ප්‍රකාශනය ..............................................................................

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය

# චිත්‍ර කලාව - II

කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
| --- |

සැලකිය යුතුයි.

- ★ ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ පසු **පිටේ** පැහැදිලි ව ලියන්න.
- ★ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ★ දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- ★ සියලු ම ද්‍රව්‍ය ඇස් මට්ටමෙන් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දැන්වීමට ඔබට අවසර තිබේ.

---

**නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය**

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට, චිත්‍රය නිර්මාණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අවධ්‍යයනයක යෙදෙන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න.

★ **මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

★ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- රේඛා අධ්‍යයනය

1. වෙනම කඩදාසියක රේඛා අධ්‍යයනය කරන්න.

- වර්ණ චිත්‍රය

2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම.
3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දැක්වීම
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

සැලකිය යුතුයි

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල ද්‍රව්‍ය සමූහයට
ගැළපෙන අයුරෙන් වෙනස් කර ගත හැකිය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය

# චිත්‍ර කලාව - II

| නම/ විභාග අංකයඃ |
|---|

## ශාලාධිපති උපදෙස්

**සපයා ගත යුතු ද්‍රව්‍ය**



- **පෝච්චිය සහිත** ඇන්තූරියම් ශාඛයක් (කොළ 3/4 සහිත)
- කාඩ්බෝඩ් පෙට්ටියක් (සුදු කඩදාසියකින් ආවරණය කළ)
- ඉරි /කොටු සහිත රෙදි කැබැල්ලක්
- මදක් ඉදුණු පැපොල් ගෙඩියක්
- ද්‍රව්‍ය තැබීමට සුදුසු ආධාරකයක්

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය

## චිත්‍ර කලාව - III

කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි

- උත්තර පත්‍රයේ පිටුපස ඔබගේ විභාග අංකය සහ ප්‍රශ්න අංකය පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීමට භාවිත කළ හැකිය. (ෆේල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණ චිත්‍රයක් අඳින්න.

---

### "අ" කොටස - චිත්‍ර සංරචනය

(1) මාළු අස්වැන්න සරුවෙලා. හැමෝගෙම හිත් සතුටින් පිරිලා.... වැල්ලේ ධීවරයන් කඩිසරව වැඩ කරනවා.

(2) කොවුල් නද ඇසෙනවා. රබන් හඬ වැයෙනවා. ගමේ අවුරුදු උත්සවයේ ජන ක්‍රීඩාවක නිරතවන පිරිසකගේ ඔබ සිත්ගත් අවස්ථාවක්.

(3) නිසලවූ බෝ මළුවේ බෝකොළ සුළඟට වැනෙනවා. සිත් පහන් කරගත් සැදැහැවතුන් නිසොලව භාවනාවේ යෙදෙනවා.

(4) වෙල්යාය හරිම සුන්දරයි. ගවරැළක් නිදහසේ තණ කමින් ඇදෙනවා.

### "ආ" කොටස - මෝස්තර නිර්මාණය

(5) ළමා මනස ආකර්ශනය වන පරිදි දේශීයව නිෂ්පාදනය කරනු ලබන දියර කිරි නිෂ්පාදනයක් සඳහා වර්ණවත් ඇසුරුමක් නිර්මාණය කරන්න.

(6) 'ඉතිරිකිරීම පවුලේත් රටේත් සංවර්ධනයයි.' අදහස දැනවෙන පරිදි නිර්මාණාත්මක නව බැංකු ලාංඡනයකට සුදුසු සැලසුමක් නිර්මාණය කරන්න.

(7) 'වැඩිහිටියන්ගේ ලෝකය සුන්දර මෙන්ම ආරක්ෂාකාරී කිරීමද අපසතු යුතුකමකි.' තේමාව ජනතාව අතරට ලබාදීම සඳහා පෝස්ටරයක් නිර්මාණය කරන්න.

### "ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

(8) සාම්ප්‍රදායික සැරසිලි රටාවන් යොදා ගනිමින් අලංකාර පතාකයක් සඳහා සුදුසු සැලසුමක් නිර්මාණය කර වර්ණ කරන්න.

(9) මලක්, කොළයක් හා මල් පොහොට්ටුවක් යොදා ගනිමින් ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.

(10) විහිදෙන ආලෝකයේ රටාවන් නැවුම් අර්ථයක් ගෙන දෙමින් විදුලි පහන් ආවරණයකට සුදුසු ලෙස මෝස්තරයක් නිර්මාණය කරන්න.

## පිළිතුරු පත්‍රය - I පත්‍රය (ලිඛිත)

| | | | |
|---|---|---|---|
| (1) දළදා මාලිගය | (2) පත්තිරිප්පුව | (3) දේවේන්ද්‍ර මූලාචාරි | (4) මහනුවර |
| (5) නෙළුමක් | (6) ගඩලාදෙණිය | (7) 32 | (8) ගල් |
| (9) තරංගාකාරව / දියරැළි ආකාරයට | | (10) ලියනාඩෝ ඩාවින්චි | (11) (3) |
| (12) (1) | (13) (4) | (14) (4) | (15) (1) |

(16) අඩ සඳක ආකාරයට ගලින් කරන ලද කැටයම් සහිත නිර්මාණයකි. / බෞද්ධ පූජනීය ස්ථානවලට පිවිසුම් දොරටුවේ පඩි පෙළ ඉදිරිපස ඇති අර්ධ කවාකාර කැටයම් සහිත ගල් ලැල්ලකි. / භව චක්‍රය (සසර ගමන) නිරූපණය කර අර්ධ කවාකාර ගල් පුවරු කැටයමකි.

(17) චෛත්‍යක ආරක්ෂාව සඳහා ඒ වටා ඉදිකරන ලද ගෙය වේ.

(18) කාන්තාවක් සහ ලියවැල් සම්මිශ්‍රව නිර්මාණය වුණු මහනුවර යුගයට අයත් මෝස්තරයකි.

(19) මිසරයේ පාරාවන්ගේ සොහොන්කොත් මේ නමින් හැඳින්වේ.

(20) තෙත බදාම මත සිතුවම් ඇඳීමේ ක්‍රමය වේ.

| | | | |
|---|---|---|---|
| (21) C | (22) D | (23) E | (24) B |
| (25) A | (26) බාහිර | (27) ටැම්පිට | (28) වාත්තු |
| (29) පූර්ණ | (30) සනිකවාදී | (31) ගම්පොළ | (32) ලංකාතිලක විහාරය |
| (33) ඉන්දියාව | (34) සෝලියස් මැන්දිස් | (35) පැපිරස් | |

(36) රෆායෙල් සන්ත්සියෝගේ විශිෂ්ඨ නිර්මාණයකි.

(37) මෙය තණපිටියේ සිටින මැඩෝනා නමින් හඳුන්වයි.

(38) මෙය ඉතාලි පුබුදු යුගයට අයත් ය.

(39) ලී පුවරුවක් මත තෙල් සායමින් කරන ලද මෙම සිතුවමෙහි ත්‍රිමාණ බව මනා ලෙස මතුවෙන ආකාරයට වර්ණ ගන්වා ඇත.

(40) මරියතුමියගේ සොම්නස හා සෙනෙහස මතු කිරීමට ශිල්පියා උත්සාහ ගෙන ඇත.

## II පත්‍රය

**ලකුණු දීමේ නිර්ණායක :** ස්වභාවිකත්ව අධ්‍යයනය හා ද්‍රව්‍ය සම්පිණ්ඩනය

| | |
|---|---|
| (1) ද්‍රව්‍ය අධ්‍යයනයේ දී නිදහස්ව, අර්ථවත්ව, රේඛාව හැසිරවීම | - ලකුණු 05 |
| (2) තලය අර්ථවත්ව හැසිරවීම | - ලකුණු 05 |
| (3) පරිමාණය හා ගති ස්වභාවය | - ලකුණු 05 |
| (4) සිද්ධාන්ත භාවිත අවබෝධය (පර්යාවලෝකය, ඝණත්වය, ඇස් මට්ටම) | - ලකුණු 05 |
| (5) වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම | - ලකුණු 05 |
| (6) සමස්ත නිමාව / පසුබිම දක්වීම | - ලකුණු 05 |
| II වන පත්‍රය සඳහා හිමි ලකුණු | - ලකුණු 30 |

## III පත්‍රය - "අ"කොටස - ප්‍රකාශන චිත්‍ර

**ලකුණු දීමේ නිර්ණායක**

(1) තෝරාගත් මාතෘකාව ප්‍රකාශන හැකියාව - ලකුණු 06
(2) රේඛා හැඩතල, මානව රූ ඇතුළු සියලු වස්තු සංරචනය - ලකුණු 06
(3) සිද්ධාන්ත භාවිතය (පර්යාලෝකය, පරිමණ වැනි) - ලකුණු 06
(4) වර්ණ භාවිතය - ලකුණු 06
(5) අනුමත ශෛලියට අනව චිත්‍රයේ සමස්ත නිමාව - ලකුණු 06
මුළු ලකුණු - ලකුණු 30

## III පත්‍රය "ආ"කොටස - මෝස්තර නිර්මාණය

**ලකුණු දීමේ නිර්ණායක**

(1) තෝරාගත් මාතෘකාවට උචිත අයුරින් නිර්මාණය කිරීමේ හැකියාව - ලකුණු 06
(2) පාරිභාරික අවශ්‍යතාවට ගැළපෙන බව - ලකුණු 06
(3) නිර්මාණාත්මක හැකියාව හා තලය භාවිතය - ලකුණු 06
(4) උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීමේ හැකියව - ලකුණු 06
(5) විචිත්‍රත්වය, චමත්කාර හා සමස්ත නිමාව - ලකුණු 06
මුළු ලකුණු - ලකුණු 30

## III පත්‍රය "ඉ"කොටස - ග්‍රැෆික් චිත්‍ර

**ලකුණු දීමේ නිර්ණායක**

(1) මාතෘකාවට හා නිර්මාණ කාර්යයට උචිත අයුරින් නිර්මාණය - ලකුණු 06
(2) වාණිජමය හා කර්මාන්තයට උචිත අයුරින් සැලසුම් කිරීම. - ලකුණු 06
(3) රේඛා හා හැඩතල අර්ථවත්ව භාවිත කිරීමේ හැකියාව - ලකුණු 06
(4) උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීම. - ලකුණු 06
(5) විචිත්‍රත්වය, චමත්කාරය හා සමස්ත නිමාව - ලකුණු 06
මුළු ලකුණු - ලකුණු 30

| | | | | |
|---|---|---|---|---|
| **(i)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 40 |
| **(ii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| **(iii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| | | මුළු ලකුණු | = | 100 |